Abstract No: HSS 42 Humanities, and Social Sciences

# ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක් වූ ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ සංකුචිත භාර්යා සහලක්ෂණය පිළිබඳ අධ්‍යයනයක් (Battered women syndrome)

**කේ. පී. එච්. එම්. කාරියවසම්[1*]**

[1]සමාජීය විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය කාන්තාවට එරෙහිව සමස්ත ලෝකය තුළම පොදුවේ සිදුවන බරපතල අපරාධයකි. ශ්‍රී ලංකාව තුළ වර්තමානය වන විට ගෘහස්ත ප්‍රචණ්ඩත්වය සුලභව වාර්තාවන අපරාධයක් බවට පත්ව ඇත. මෙයට ලක්වන කාන්තාවන් කායික, මානසික සහ සාමාජීය වශයෙන් විශාල පීඩනයකට පත්වී ඇත. එවැනි කාන්තාවන් දක්වන කායික, මානසික හා චර්යාමය ප්‍රතිචාර සමූහයක් ලෙස *සංකුචිත භාර්යා සහලක්ෂණය (Battered women syndrome)* හැඳින්වේ. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක් වූ ලාංකික කාන්තාවන් තුළ සංකුචිත භාර්යා සහලක්ෂණය පවතී ද යන්න අධ්‍යනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය. සංකුචිත භාර්යා සහලක්ෂණය සමග වෙනත් මානසික රෝග ඇති වීම අතර සහසම්බන්ධතාවය හඳුනාගැනීම, එහි බලපෑමෙහි වෙනස අධ්‍යනය කිරීම සෙසු අරමුණ විය. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක් වූ වයස අවුරුදු 18ත් 45ත් අතර කාන්තාවන් 15 දෙනකු නියැදිය ලෙස ගනිමින් සංකුචිත භාර්යා සහලක්ෂණයේ ලක්ෂණ ඇතුළත් ප්‍රශ්නාවලියක් ලබා දෙමින් දත්ත රැස්කර ඒවා ප්‍රමාණාත්මකව විශ්ලේෂණය කරන ලදී. පර්යේෂණ ප්‍රතිඵල අනුව සංකුචිත භාර්යා සහලක්ෂණයට අයත් කායික, මානසික හා චර්යාමය ලක්ෂණ අවම වශයෙන් එක් ලක්ෂණය බැගින් *ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට* ලක් වූ කාන්තාවන් තුළ දක්නට ලැබෙන බවත් කායික ලක්ෂණවලට සාපේක්ෂව මානසික හා චර්යාමය ලක්ෂණ සංඛ්‍යානමය වශයෙන් වැඩි අගයක් පෙන්වන බවත් සොයා ගැනිණි. සංකුචිත භාර්යා සහලක්ෂණය තීව්‍ර මට්ටමින් පරීක්ෂාමාණීන් තුළ පවතින බවත්, වෙනත් මානසික රෝග ඇති වීම හා එහි රෝග ලක්ෂණ අතර ඉහළ ධනාත්මක සහසම්බන්ධයක් පවතින බවත් පර්යේෂණ ප්‍රතිඵල අනුව සොයා ගැනිණි. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක් වූ කාන්තාවන්ගේ මානසික සෞඛ්‍ය නගා සිටුවීම සඳහා *උපදේශන සහ මනෝ ප්‍රතිකාර* වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් ඔවුන් ඒ සඳහා යොමු කිරීම අවශ්‍ය සාධකයක් ලෙස පර්යේෂණයේ දී තහවුරු විය. අනාගත පර්යේෂණයක් සඳහා සමාජය තුළ ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට ලක් වූ පුරුෂයන් තුළ සංකුචිත පුද්ගල ව්‍යසන ලක්ෂණ පවතී ද යන්න අධ්‍යනය කිරීම සහ සංකුචිත ව්‍යසන සහලක්ෂණයේ බලපෑම අතර සහසම්බන්ධතාව සෙවීම සුදුසු යැයි යෝජනා කළ හැකිය.

**මුඛ්‍ය පද :** උපදේශන සහ මනෝ ප්‍රතිකාර ක්‍රම, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, මානසික රෝග, ශ්‍රී ලාංකික කාන්තාවන්, සංකුචිත භාර්යා සහ ලක්ෂණය

* kariyawasamharshi@gmail.com